## අළු බදාදාට පසු සිකුරාදා

### පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 58: 1–9

ඉසයියස් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

*මට ප්‍රියමනාප උපවාසය මෙය වේ.*

සමිඳාණෝ මෙසේ වදාරණ සේක. "නොනැවතී මහ හඬින් මොරගසා, හොරණෑවක් මෙන් නුඹේ හඬ නගා, මාගේ ඉශ්රායෙල් සෙනඟට ද ජාකොබ්ගේ වංශයට ද ඔවුන්ගේ වැරදි හා පව් දන්වන්න.

ඔව්හු දැහැමි ක්‍රියා කරන, දෙවිඳුන්ගේ නියෝග අත්හැර සිටින ජාතියක් යයි සිතාගෙන, දවස් පතා මා සොයති. මාගේ මාර්ගයන් දැනගන්න ප්‍රසන්න වෙති. සාධාරණ විනිශ්චයයන් මාගෙන් ඉල්ලති. දෙවිඳුන් වෙත ළඟා වීමට ප්‍රසන්න වෙති. සමිඳුන් සලකන්නේ නැත්නම්, අප උපවාස කරන්නේ කුමට ද? එතුමන් සිතට ගන්නේ නැත්නම් අප වද විඳින්නේ කුමටදැ"යි සෙනඟ අසති. සමිඳාණෝ ඔවුන්ට මෙසේ වදාරණ සේක. "නුඹලා උපවාසයේ යෙදී සිටින අතර නුඹලාගේ සැප පහසුව සොයමින් නුඹලාගේ සේවකයන්ට හිරිහැර කරන්නහු ය. නුඹලා උපවාසයේ යෙදී සිටින අතර, විවාදයටත්, තරඟයටත්, දුෂ්ඨ පහර දීමටත් පෙළඹෙන්නහුය. මෙලෙස මෙදින උපවාස කිරීමෙන් නුඹලාගේ යැදුම් සගයට නොනැගේ.

නුඹලා උපවාස කරන දවසේ දී නුඹලාට ම වද වේදනා කරගෙන, පන් ගසක් මෙන් හිස නමාගෙන ගෝණි රෙදි සහ අළු අතුරා ඒ පිට හිඳගන්නහු ය. උපවාසයෙන් නුඹලා අදහස් කරන්නේ එය ද? එවැනි උපවාස දවසක් සමිඳුන්ට ප්‍රසන්න යයි නුඹලා සිතන්නහු ද? මට ප්‍රිය මනාප උපවාසය මෙය වේ. දුෂ්ට

කමේ විලංගු මුදා හැර, අයුක්තියේ බැඳුම් ලිහා හැර, පීඩිතයන් නිදහස් කර හැර, සියලු වියගස් බිඳ දැමීම ය.

සාගින්නෙන් පෙළෙන අය සමග ආහාර බෙදා ගැනීම ද, ගේ දොර නැති අසරණයන් ඔබේ ගෙදරට කැඳවීම ද, ඇඳුම් නැති අය දුටු විට ඇඳුම් සපයා දීම ද, සැබෑ මිතුරන් මග නොහැර යුතුකම් ඉටු කිරීම ද නියම උපවාසය වේ. එවිට අරුණෝදය මෙන් මාගේ එළිය උදා වී ඉක්මණින් නුඹලාට සුව සෙත ගෙන දේවි. ඔබේ දැහැමි සිරිය ඔබ පෙරටුවෙන් ද, සමිඳුන්ගේ තෙද සිරිය ඔබ පසුපස ද, ඔබේ සුරැකියාව සඳහා ගමන් ගන්නේය. එකල නුඹලා යාච්ඤා කරන විට මම පිළිතුරු දෙන්නෙමි. මට නුඹලා හඬ නගන විට “මම මෙහි ය”යි පිළිතුරු දෙන්නෙමි.

දේව වචනය මෙසේ ය.

| පිළිතුරු ගීය | ගීතාවලිය 51: 1-4, 16-17 |
|---|---|

පිළිතුර:　දෙවිඳුනි, ඔබ තැළුණු, බිඳුණු සිතක් ඉවත නොදමන සේක.

ගීය:

දෙවිඳුනි, ඔබේ දයා කරුණාවෙන් මට අනුකම්පා කළ මැනව. ඔබේ විපුල දයාවෙන් මාගේ අපරාධ මකා දැමුව මැනව. මාගේ කෙලෙස් මලින් මා මුළුමනින් සෝදාලුව මැනව. මාගේ පාප මලින් මා පිවිතුරු කළ මැනව.

මාගේ අපරාධ මම මැනවින් දනිමි. දිවා රෑ දෙක්හි මාගේ පාප මට සිහිවේ. ඔබට විරුද්ධව, ඔබට පමණක් විරුද්ධව මම පව් කළෙමි. ඔබ හමුවෙහි මම නපුර කළෙමි.

ඔබ පුද පඬුරු වලට රිසි නැත. ඔබ ඒවාට රිසි නම් මම ඒවා ඔබට පුදන්නෙමි. දවන යාග පූජාවලට ද ඔබ රිසි නොවන සේක.

දෙවිඳුන් ප්‍රිය පඬුර නම් බිඳුණු හදවතකි. දෙවිඳුනි, ඔබ තැළුණු බිඳුණු සිතක් ඉවත නොදමන සේක.

| සුපුවත් ජය නද |
|---|

"ජීවත්වන පිණිස නපුර නොව යහපත සොයන්න.
එවිට ඔබ සමඟ සිටින සේක" යි ඔබ කියන
සියලු බලැති දෙව් සමිඳාණන් වහන්සේ ඇත්තෙන් ම
ඔබ සමඟ සිටින සේක."

**සුවිශේෂය** **මතෙව් 9: 14-15**

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

*මනාලයා ඔවුන් කෙරෙන් වෙන් කරනු ලබන දින දී ඔවුන් උපවාස කරනු ඇත.*

එකල ජුවාම්ගේ ගෝලයෝ උන් වහන්සේ වෙත අවුත්, "පරිසිවරුත් අපිත් නිතර උපවාස කරමු. එහෙත් ඔබේ ගෝලයන් උපවාස නොකරන්නේ මන්දැ"යි ඇසූහ. ජේසුස් වහන්සේ ඔවුන්ට කතා කොට මෙසේ වදාළ සේක. "මනාලයා තමන් සමඟ සිටියදී ඔහුගේ ඥාති මිත්‍රාදීන්ට ශෝක විය හැකිද? නොහැකිය. එහෙත් මනාලයා ඔවුන් කෙරෙන් වෙන් කරනු ලබන දවසක් පැමිණේ. ඔවුන් ඒ දවසේ දී උපවාස කරනු ඇත."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.